**පොලිස් මාධ්‍ය කොට්ඨාසය**
**பொலிஸ் ஊடகப் பிரிவு**
**POLICE MEDIA DIVISION**
**14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල**

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| දිනය Date | 2025.04.17 පැය 2310 | දුරකථන අංකය Tel.NO | 011-2887973 | මගේ අංකය My NO | D/Media/Out/ 765/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ප්‍රධාන කර්තෘ / ප්‍රවෘත්ති කර්තෘ,**
**අධ්‍යක්ෂ ප්‍රවෘත්ති / ප්‍රවෘත්ති කළමණාකරු,**
**සියළුම මාධ්‍ය ආයතන.**

**<u>පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය.**

2025.04.17 වන අද දින දහවල් කාලයේ කිරිබත්ගොඩ පොලිස් වසමේ කිරිබත්ගොඩ නගරයේදී බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර හෙරොයින් ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 52 ක් වන පේරාදෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බස්නාහිර පළාත උතුර අපරාධ කොට්ඨාසය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**02. දියේ ගිලී තරුණයෙකු අතුරුදන්වීමක් - නාවලපිටිය පොලිස් වසම.**

2025.04.17 වන අද දින උදෑසන කාලයේ නාවලපිටිය පොලිස් වසමේ ගලබඩ දියඇල්ලේ දිය නාමින් සිටි තරුණයෙකු දියේ ගිලී අතුරුදන්ව ඇති බවට නාවලපිටිය පොලිසියට ලද පණිවිඩයක් මත විමර්ශන ආරම්භ කර ඇත.

**අතුරුදන් වූ පුද්ගලයා වයස අවුරුදු 20 ක් වූ වෙස්ට්හෝල් වත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

අතුරුදන් වූ පුද්ගලයා තවත් මිතුරන් තිදෙනෙකු සමග දිය නාමින් සිටියදී දියේ ගිලී අතුරුදන් වී ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

අතුරුදන් වූ අය සොයා නාවලපිටිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - සමනලවැව පොලිස් ස්ථානය.**

2025.04.17 වන අද දින දහවල් කාලයේ සමනලවැව පොලිස් වසමේ බලිදුවාව ප්‍රදේශයේදී සමනලවැව පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **මෙරට නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 31 ක් වන මුල්ගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

සමනලවැව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් හා වීඩියෝ පටයක් මේ සමඟ යොමු කරමි.

**04. විදේශීය රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - බිබිල පොලිස් ස්ථානය.**

2025.04.17 වන අද දින දහවල් කාලයේ බිබිල පොලිස් වසමේ හාමාපොල ප්‍රදේශයේදී බිබිල පොලිස් ස්ථානයේ නිලධාරීන් කණ්ඩායමක් විසින් ලද තොරතුරක් මත වැටලීමක් සිදුකර **විදේශීය රටක නිෂ්පාදිත බෝර 12 වර්ගයේ ගිනි අවියක් හා එම උණ්ඩ 08ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන ඇත.

**සැකකරු වයස අවුරුදු 49 ක් වන පිටකුඹුර, බිබිල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

බිබිල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි. වැටලීමට අදාල ඡායාරූපයක් මේ සමඟ යොමු කරමි.

**05. මාරක රිය අනතුරක් - යක්කලමුල්ල පොලිස් වසම.**

2025.04.16 වන දින රාත්‍රී කාලයේ යක්කලමුල්ල පොලිස් වසමේ යක්කලමුල්ල අකුරැස්ස මාර්ගයේ මලන්දෙනිය කන්ද අතුරු මාර්ගයේ පෙලෙන්ගස්හේන ප්‍රදේශයේදී යක්කලමුල්ල දෙස සිට කරාගොඩ දෙසට ධාවනය වූ ජීප් රථයක් රියදුරුට රථය පාලනය කර ගැනීමට නොහැකිව බෑවුමකට පෙරලී ගොස් අනතුරක් සිදුව ඇත. අනතුරින් ජීප් රථයේ රියදුරු, කාන්තාවන් දෙදෙනෙකු හා කුඩා දරුවෙකු තුවාල ලබා කාරාපිටිය රෝහලට ඇතුලත් කිරීමේදී එක් කාන්තාවක් මියගොස් ඇත.

**මරණකාරිය වයස අවුරුදු 29 ක් වූ ගල්මුල්ල, යක්කලමුල්ල ප්‍රදේශයේ පදිංචිකාරියෙකි.**

මරණකාරිය තවත් කාන්තාවක් හා කුඩා දරුවෙකු සමග පා ගමනින් යමින් සිටියදී ජීප් රථය පැමිණ ඇති අතර ගමන් පහසුව තකා ඔවුන් ජීප් රථයට නැගී ගමන් කර ඇති බවට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත.

මෘත ශරීරය කරාපිටිය රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර යක්කලමුල්ල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. මාරක රිය අනතුරක් - කොටදෙනියාව පොලිස් වසම.**

2025.04.17 වන අද දින දහවල් කාලයේ කොටදෙනියාව පොලිස් වසමේ මැල්ලවගෙදර පන්නල මාර්ගයේ මානිංගමුව ප්‍රදේශයේදී මැල්ලවගෙදර දෙස සිට පන්නල දෙසට ධාවනය වූ මෝපෙඩ් වර්ගයේ යතුරුපැදියක් පැදිකරුට පාලනය කර ගැනීමට නොහැකිව මාර්ගයෙන් ඉවතට පැන විදුලි රැහැන් කණුවක ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු මීගමුව රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 71 ක් වූ දිවුලපිටිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය මීගමුව රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කොටදෙනියාව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**07. මාරක රිය අනතුරක් - නාගොඩ පොලිස් වසම.**

2025.04.17 වන අද දින සවස් කාලයේ නාගොඩ පොලිස් වසමේ බද්දේගම නාගොඩ මාර්ගයේ කැප්පෙටියගොඩ ප්‍රදේශයේදී බද්දේගම දෙස සිට නාගොඩ දෙසට ධාවනය වූ යතුරුපැදියක් මාර්ගයේ සිටි ගවයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් බරපතල තුවාල ලැබූ පැදිකරු නාගොඩ රෝහලට ඇතුලත් කිරීමේදී මියගොස් ඇත.

**මරණකරු වයස අවුරුදු 42 ක් වූ තල්ගස්වල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෘත ශරීරය නාගොඩ රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර නාගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**